# ආගම හා නිර්මාණයක කලාත්මකත්වය අතර වන ද්විසට්ටනය සමනය කිරීම වස් බෞද්ධ දර්ශනයේ උපයෝගීතාව

ඩබ්. එම්. ඩබ්. එම්. විජේතුංග[1]

**හැඳින්වීම**

අතීතයේ බෞද්ධ ආගම හා කලා නිර්මාණ එකිනෙකින් අන්තර්පෝෂණය ලැබූ නමුත් අද්‍යතන යුගයේදී එම තත්ත්වය වෙනස්ව ආගම හා කලා නිර්මාණ පැහැදිලිවම විභේදනය වූ ස්වභාවයක් ගනියි. ඇතැම් අවස්ථාවල බෞද්ධාගමික තේමා කේන්ද්‍ර වූ කලා නිර්මාණ බිහිවූවත් 'කලාව කලාව සඳහාය' යන අදහස තරයේ වැළඳ ගත් වත්මන් සාහිත්‍ය කලා කතිකාව එකී නිර්මාණ ගැඹුරු දර්ශනයකින් යුක්තයැයි පිළිනොගනී. එවැනි නිර්මාණ සැබෑ ලෙසම කලා නිර්මාණ නොවන ප්‍රචාරණ මාධ්‍යය ලෙස පවා ඇතැම් විටක සැලකෙන අතර ඒ පිළිබඳ විචාර ගොඩනඟන්නේ ද අනොලොස්සක් පමණය. කලාව යනු ආගමින් දුරස්ව පැවතිය යුතු මාධ්‍යයක් බව බොහෝ සාහිත්‍ය කලා සාකච්ඡා තුළින් හැඟවෙයි. බුදු දහම හා කලාව අතර වන ද්විසට්ටනය යනුවෙන් අදහස් වන්නේ මෙම ගැටුමයි.

**පර්යේෂණ තොරතුරු**

ආගම තේමා කොටගත් බොහෝ නිර්මාණ බහුතර පාඨකයා වැළඳ නොගන්නා නමුත් බෞද්ධාගම හා සබැඳි ප්‍රස්තුත විෂය කරගත් ඇතැම් නිර්මාණ සාහිත්‍ය කතිකාව තුළ සුවිශේෂ ලෙස මතුව විදග්ධ විචාරවලට හසුවන බවත් චිරාත් කාලයක් පාඨකයා අතර රැඳී පවතින බවත් දක්නට හැකිය. ඇතැම් නිර්මාණ කලා නිර්මාණ නොවේයැයි ජනයාගෙන් දුරස් වන විට තවත් නිර්මාණ කිහිපයක් මෙසේ ඇගයීමට ලක්වීමට සුවිශේෂ සාධකයක් පැවතිය යුතුය. එය වනාහී බෞද්ධ ආගම වෙනුවට බෞද්ධ දර්ශනය ප්‍රස්තුතය කරගැනීම විය යුතු වන අතර මෙම සාකච්ඡාවේ උපන්‍යාසය වන්නේද එයමය.

බෞද්ධ දර්ශනය ආශ්‍රයෙන් ලියවෙන කලා කෘති ජනතාව අතර සර්වකාලීන ලෙස පවතින්නේ නම් ලක්දිව බුදුදහමේ උන්නතිය වස් කලා නිර්මාණයේලා එහි වැදගත්කම අවධාරණය කිරීම මෙම ගවේෂණයේ අරමුණයි.

පර්යේෂණ නියැදිය

[1] සහාය කථිකාචාර්යාණී , සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. wishwanimaheshika@gmail.com

| නවකතා | කාව්‍ය කෘති |
|---|---|
| සයිමන් නවගත්තේගම - සංසාරාරණ්‍ය අසබඩ | මහගම සේකර - ප්‍රබුද්ධ |
| දයාවංශ ජයකොඩි - 'පිච්ච මල' කතා මාලාව | ගුණදාස අමරසේකරගේ තෝරාගත් කවි |
| කැත්ලින් ජයවර්ධන - සත්‍යකාම | |

**ක්‍රමවේදය**

පුස්තකාල පරිශීලනය පර්යේෂණයේ ක්‍රමවේදයයි. නූතන නවකතා හා කාව්‍ය විචාර ශිල්පීය ක්‍රම ඇසුරෙන් සාකච්ඡාව සිදු කෙරෙයි.

**ප්‍රතිඵල**

1. කලා නිර්මාණවල බෞද්ධ ආගම නිරූපණයට තැත් කිරීමෙන් කලාත්මකත්වය හා ඝට්ටනයක් ඇති වන නමුත් බෞද්ධ දර්ශනය කේන්ද්‍ර වන නිර්මාණයක කලාත්මකත්වය සුරක්ෂිත වෙයි. එහෙයින්ම පාඨකයා එවැනි කෘතිවලට ආසක්ත වෙයි.
2. කලා නිර්මාණ තුළින් බුදුදහම ප්‍රබෝධමත් කිරීම උදෙසා බෞද්ධ ආගම ප්‍රස්තුත කරගැනීමට වඩා බෞද්ධ දර්ශනය උපයුක්ත කරගැන්ම වඩා උචිතය.

**සාකච්ඡාව**

ආගම හා ආගමික දර්ශනය වූ කලී එකිනෙකට බෙහෙවින් වෙනස් සංකල්ප ද්විත්වයකි. ආගම යනු ලබ්ධිය හෙවත් ඇදහීමයි. බුදුදහම ලක්දිවට රැගෙන ඒමට පෙර මිනිසුන් ස්වභාව ධර්මය වන්දනාවේ නිග්ම වූයේ ගැඹුරු අවබෝධයකින් නොව ඒ කෙරෙහි ඇතිකරගත් මවිතය, කුතුහලය, බිය වැනි සාධක හේතුවෙනි. එම ඇදහීම තුළ සංකීර්ණ දර්ශනයක් නොවූ අතර ස්වකීය මානසික ස්වස්ථතාව පිණිස එවැනි චාරිත්‍ර වාරිත්‍රවල ජනයා යෙදුණු නමුත් තමා මානසික සුවය පිණිස ඇදහීම් තදින් වැළඳගත් බව නොදන සිටීම විශේෂත්වයයි. ඇදහීම් කුමකටද යන්න මිනිසා නොදන සිටීම නිසා ඇදහීම් තවදුරටත් ඇදහීම් විලාශයෙන්ම සුරක්ෂිතව දර්ශනයක් බවට පරිවර්තනයක් නොවී පවතියි. දර්ශනයක් වූ කලී ඇදහීම පසුකර බොහෝ දුරක් චිත් භක්තිය නොව යථාර්ථය හෙළිකරන්නකි. එය වඩා වාස්තවීය ස්වභාවයකින් යුත් බුද්ධි ගෝචර සංකල්ප එකතුවකි. බුද්ධි ගෝචර ස්වභාවය නිසා දර්ශනයක් යාවත්කාලීනය. දර්ශනය ඇදහීම මෙන් භක්තියේ නිමාවත් සමඟ ශූන්‍ය නොවේ. බුදුදහමේ එන බෞද්ධ

දර්ශනය යනු එහි එන හරයාත්මක බුද්ධිමය දැක්මයි. බෞද්ධ ආගම යනු ලබ්ධිය හෙවත් ශ්‍රද්ධාව ඇමතීමය.

චිරාත් කාලයක් තිස්සේ සිංහල සම්භාව්‍ය ගද්‍ය, පද්‍ය සාහිත්‍යයේ හරය ආගමික සන්දර්භයක් වටා කේන්ද්‍රව පැවතියේ මූලිකවම අනුරාධපුර යුගයේදී ලියවුණු 'සියබස්කලරෙන්' ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථ මෙසේ ආගමික තේමා වෙතට සීමා කළ හෙයිනි. බුදුදහම සම්භාව්‍ය කලා කෘති තුළ නිරූපණය වූයේ සමාන ආකාරයකින් නොවේ. හුදෙක් ආගමික භක්තිය පමණක් වර්ධනය කරන ග්‍රන්ථ හා කලාත්මකත්වය තුළින්ම දාර්ශනික ප්‍රවේශයක් වෙත පාඨකයා රැගෙන යන ග්‍රන්ථ ලෙසය. මෙසේ ශ්‍රද්ධාව වර්ධනය වස් බොහෝ සාහිත්‍ය කෘති නිර්මාණය වන නමුත් බෞද්ධ දර්ශනය විවරණය කරන සාහිත්‍ය කෘති විරලව නිර්මාණය වූ අතර යටත් විජිත පාලන සමයේ තවදුරටත් බෞද්ධ දර්ශනයට එකඟ සාහිත්‍ය කෘති නිර්මාණය පසුගාමී තත්ත්වයක් ගත් ආකාරයක් විචාරක්ෂියට හසු වෙයි. දහඅටවන ශතවර්ෂයේදී යටත්විජිත පාලනයටත්, ක්‍රිස්තියානි දහමටත් අභියෝග කරනු වස් ගද්‍ය ආඛ්‍යාන, පද්‍ය බිහි වූ නමුත් ඒ සියල්ලේ හරය බෞද්ධ ආගමයි. පියදාස සිරිසේන පවා ආගම මිස බෞද්ධ දර්ශනය ඉදිරිපත් නොකළේ තත් යුගයේ අවශ්‍යතාව දර්ශනයක් නොව ආගමක් ව්‍යාප්ත කිරීම බව දත් හෙයිනි. එහෙත් ඒ වන විට බටහිර සාහිත්‍ය කලා ආලෝකය ලක්දිවට වැටී තිබුණි. එම නව්‍ය කතිකාවලට අනුව පියදාස සිරිසේනගේ බෞද්ධ ආගම උත්කර්ෂණය කරන 'වාසනාවන්ත විවාහය', 'අපේ ආගම', අපට වෙච්ච දේ' වැනි නිර්මාණ කලාත්මකත්වයෙන් තොරයැයි විවේචනය වෙයි. බුදු ගුණ සාහිත්‍යයට භක්තිය ප්‍රමුඛ ආගමික සාකච්ඡා උචිත නමුත් නවකතාව වැනි බටහිර සාහිත්‍යාංගවලට එය නොපෑහෙන හෙයින් ආගමික අරමුණු වෙනුවෙන් ක්‍රියාකරන සාහිත්‍ය නිර්මාණවලට පටු අරමුණු වෙනුවෙන් ක්‍රියා කරන්නේයැයි චෝදනා එල්ල වෙයි. නූතන සාහිත්‍ය ප්‍රවණතා හේතුවෙන් පාඨකයා ආගමික භක්තිය ඉස්මතු කරන ග්‍රන්ථවලින් වියුක්ත වන්නට උත්සහ දැරීම කරණකොටගෙන නිර්මාණකරුවා ද එකී ප්‍රස්තුතයෙන් දුරස්ව නූතනවාදී ප්‍රවණතා අනුගමනය කිරීමට උත්සහ කළ බැව් ප්‍රතීයමානය.

කලාවත් ආගමත් අතර වන මෙම ද්විසට්ටනය සාර්ථක ලෙස සමනය කරගත් නිර්මාණකරුවන් විශ්ව සාහිත්‍ය තුළ මෙන්ම ලාංකේය සාහිත්‍යයේද නොමැත්තේ නොවේ. විශිෂ්ට කෘති විරචිත ඇල්බයා කැමූ, හර්මන් හෙසේ ආදීහු බෞද්ධ දාර්ශනික සංකල්ප රැගත් කෘති විශ්ව සාහිත්‍යයට තිළිණ කළහ. සයිමන් නවගත්තේගම, කැත්ලීන් ජයවර්ධන, ජයසේන ජයකොඩි වැනි නවකතා නිර්මාණකරුවන් පමණක් නොව මහගම සේකර, ගුණදාස අමරසේකර, නන්දන වීරසිංහ, ආදී කවීන් ලාංකේය සාහිත්‍යයට එවැනි බෞද්ධ දාර්ශනික අදහස් රැගත් ග්‍රන්ථ නිර්මාණය කරන බව දැකිය හැකිය. පියදාස සිරිසේන වැනි ආරම්භකයන්ගේ නිර්මාණ මෙන් එම නිර්මාණ කලාකාමී ජනයාගෙන් ප්‍රතික්ෂේප ද නොවෙයි. මෙම

තත්වයට උපස්ථම්භක හේතුව වන්නේ අන්‍ය කිසිවක් නොව ඔවුන් බෞද්ධ දර්ශනය මිස බෞද්ධ ආගම නිරූපණයට තැත් නොකිරීමයි.

නූතන සාහිත්‍ය පාඨකයා ගෝලීයකරණ ලොව තුළ විශ්ව සාහිත්‍ය ගවේෂණය කරන්නෙකු හෙයින් භාවමය ආගමික ශ්‍රද්ධාව ඔවුන්ගේ කියවීමට උචිත ප්‍රස්තුතයක් නොවේ. එහෙත් බුද්ධිමය දාර්ශනික සාහිත්‍ය නිර්මාණ ඔවුනතර බැහැර නොවී පවතින බැව් විද්‍යමානය.

## නිගමනය

බුදුදහමේ එන අතිශයෙන් වැදගත් සංකල්ප ලාංකේය ජනයා අතර ප්‍රතිස්ථාපනයට කලාව වූ කලී මනා භාවිතයකි. එනමුත් කලාවේ මූලික ස්වභාවයට ප්‍රතිවිරුද්ධ ආගමික සංකල්ප නොව දාර්ශනික සංකල්ප තුළින් කලා කෘති ප්‍රතිනිර්මාණය කළ හැකි නම් එය කලා කෘති පාඨකයාගෙන් ප්‍රතික්ෂේප නොවී ඔවුන් සංකීර්ණ දහමක ගැඹුරට ප්‍රවේශ කළ හැකි මාධ්‍යයක් ද වෙයි. නූතන කලා ව්‍යුහ කලානුරූපීව පාඨකයාට උචිත ලෙස හැඩගැසෙමින් ඔවුනතර නොනැසී පවතින හෙයින් ඒ තුළට බෞද්ධ දර්ශනය අන්තරීකරණය කිරීම විශිෂ්ට බෞද්ධ දර්ශනයේ පැවැත්ම ලාංකේය සන්දර්භය තුළ යාවත්කාලීන වීමට හේතු භූත වන බව ප්‍රතීයමාන වෙයි.

**ප්‍රමුඛ පද:** ආගම, දර්ශනය, බුද්ධිය, ශ්‍රද්ධාව,

## ආශ්‍රිත ග්‍රන්ථ

අරියවංශාලංකාර හිමි, හාරිස්පත්තුවේ. (2009). *'බුදුදහම ආගමක් නොවේ'* මහමිතව ප්‍රඥාසාරතන හිමි ඇතුළු පිරිස (සංස්), සමය අධ්‍යයන. පුවක්පිටිය : පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය.

කරුණාරත්න, ඩබ්, එස්. (2009). *'බුදු දහම දර්ශනයක්ද? ආගමක්ද?'* මහමිතව ප්‍රඥාසාරතන හිමි ඇතුළු පිරිස (සංස්), සමය අධ්‍යයන. පුවක්පිටිය : පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය.

වික්‍රමසිංහ, මාර්ටින්. (1968). *බෞද්ධ දර්ශනය හා මාර්ගය.* කොළඹ : එම්. ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමසූරිය, සරත්චන්ද්‍ර. (1963). *නවකතා විවරණය.* කොළඹ : සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

හෙසෙ, හර්මන්. (1979). *සිද්ධාර්ථ.* පරි. - දයාරත්න ගරුසිංහ, කොළඹ : ලේක්හවුස් ආයතනය.